6

## 1.6. පාස්කු අභිරහස තුළ අපේ විශ්වාසය තහවුරු කර ගනිමු.




- ඉහත පුවත් පත් ශීර්ෂ පාඨ පිළිබඳ ව සිතා බලන්න. එම සිද්ධීන් පිළිබඳ ඔබේ අදහස් අභ්‍යාස පොතේ සටහන් කරන්න.

**පාපයෙන් දූෂිත ලෝකයට විමුක්තිය කාගෙන් කවදා කෙසේ ලැබේ ද?**

**මුළු මනුෂ්‍ය වර්ගයාට ම ගැලවීම ලබාදීම ක්‍රිස්තුන් වහන්සේගේ ධර්මදූත කාර්යය යි. එම ධර්මදූත කාර්යයේ උච්චතම අවස්ථාව ඔවුන් වහන්සේගේ දුක් විඳීම මරණය සහ උත්ථානයයි.**

## පාස්කු අභිරහස



අභිරහසක් යනු තේරුම් ගත නොහැකි දෙයක් නොවේ. තේරුම්ගෙන අවසන් කළ නොහැකි දෙයකි.

පාස්කු අභිරහස නම් විමුක්තිදායකයාණන් වූ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ දුක් විඳීම, මරණය හා ජයග්‍රාහී උත්ථානය යි.

සකල මනුෂ්‍ය සංහතියේ විමුක්තිය පතා, ජේසුස් වහන්සේ තම ජීවිතය ඔවුන් උදෙසා දෙවි පියාණන්ට කැප කළ සේක. එය මිනිස් සංහතියේ පාපයේ විපාකය තම කරට ගැනීමකි. සකල මනුෂ්‍ය වර්ගයාගේ විමුක්තිය පතා ඔවුන් වහන්සේ තම ජීවිතය පාප පූජාවක් මෙන් දෙවි පියාණන්ට ඔප්පු කළ සේක.

**පාස්කු අභිරහසේ වරප්‍රසාදය**

අන්ධකාරයේ පාලනය මුළුමනින්ම පරාජය කරමින්, මුළු මනුෂ්‍ය සංහතියට විමුක්තියේ ආලෝකය උදාවීය.

එමගින් අපේ එදිනෙදා ජීවිතයේ ප්‍රශ්න ගැටලුවලට ක්‍රිස්තුන් වහන්සේගේ දුක් විඳීම මරණය හා උත්ථානය පිළිතුරු ලබා දී ඇත.

බව්තිස්මස්නාපනයෙන් ක්‍රිස්තුස් ජේසුස් වහන්සේ හා සමග ඒකාබද්ධ වූ අප සියල්ලන් ම එම බව්තිස්ම ස්නාපනයෙන් ඔවුන් වහන්සේගේ මරණයෙහි, ඔවුන් වහන්සේ හා සමග ඒකාබද්ධ වූ බව ඔබ නොදන්නහු ද? එබැවින් අපේ බව්තිස්ම ස්නාපනයෙන් අපිත් ඔවුන් වහන්සේගේ මරණයට, සම්බන්ධ වී ඔවුන් වහන්සේ සමග වළලනු ලැබුවෙමු. එසේ කරනු ලැබුවේ පියාණන් වහන්සේගේ මහිමාන්විත ක්‍රියාවෙන් ක්‍රිස්තුන් වහන්සේ මළවුන්ගෙන් උත්ථානය ලැබූ සේම, අප ද නව මගක ගමන් කරනු සඳහා ය. ඔවුන් වහන්සේගේ මරණය වැනි සිද්ධියකින් අපි ඔවුන් වහන්සේ සමග එක් වුණෙමු නම්, ඔවුන් වහන්සේගේ උත්ථානය වැනි සිද්ධියකින් ද අපි ඔවුන් වහන්සේ සමග එක්වන්නෙමු. මින් මතු අප පාපයට වහල් නොවන පිණිස අපේ පාපී ස්වභාවය නැති වන සේ අපේ පූර්ව මිනිස් ගතිය ඔවුන් වහන්සේ සමග කුරුසයෙහි ඇණ ගසනු ලැබූ බව අපි දනිමු.

(රෝම 6:36)

ජේසුස් වහන්සේගේ දුක් විඳීමට, මරණයට හා උත්ථානයට සහභාගි වන සෑම කෙනකුට ම මෙලොව මරණය අවසානයක් නොවේ. නව ජීවිතයකට ආරම්භයකි. සදාතනික ජීවිතයට දොරටුවකි.

- ජීවිතයේ දුක් කම්කටොලු ජීවිතයේ බර තේරුම් ගන්නේ කෙසේ ද?

- දුක් කම්කටොලු පිළිබඳ නිවැරදි ආකල්පය පැහැදිලි කරන්නේ කෙසේ ද?

ඔබ මාගේ
ප්‍රියාදර
පුත්‍රයාණෝ ය.



"මාගේ දෙවියනි,
මාගේ දෙවියනි
ඔබ මා අත්හැරියේ
මන්ද?"
(මාක් 15:34)

ස්ත්‍රීන් අතුරෙන්
ආශිර්වාද ලද්දී
ඔබ වහන්සේ ය.

"ඔබේ ම හදවත
කඩුවකින් අනිනු
ලැබුවාක් මෙන්
තුවාල වනු ඇත."
(ලූක් 2:35)



ජෝබ්,
දේව ගරු බියෙන්
හා
නො සැලෙන
විශ්වාසයකින්
ජීවත් විය.

"මව් කුසේදී ම මා
නොමළේ මන්ද?"
(ජෝබ් 3:11)


නොමිලේ බෙදා හැරීම සඳහා ය.

**දුක් කම්කටොලු**

- **දේව දඬුවමක් නොවේ.**
- **දෙවිඳුන්ගේ සාපයක් ද නොවේ.**
- **දේව පණිවිඩයක් විය හැකි ය.**

කුරුසයේ මග ගමන් කරන අපි ජේසුස් වහන්සේගේ දුක් විඳීමට මරණයට හා උත්ථානයට සහභාගි වන්නෙමු.

**ජේසුස් වහන්සේගේ මරණය සාපයක් නොව එය අපට ආශිර්වාදයකි.**

1. ශුද්ධ වූ ප්‍රේමයට තම ජීවිතය පූර්ණ ව භාර කළ
2. දෙවි පියාණන්ගේ කැමැත්තට පූර්ණ ව කීකරු වූ
3. දේව ප්‍රේමයට දේව ප්‍රේමයෙන් ම පිළිතුරු දුන්
4. මිනිසාට ශුද්ධ වූ ප්‍රේමයෙන් අසීමිත ව ප්‍රේම කළ
5. තමා පාවා දෙන, ප්‍රතික්ෂේප කරන, පීඩා කරන මිනිසාට පවා දේව ප්‍රේමයෙන් ප්‍රේම කළ
6. ශාරීරික ව, මානසික ව, ආධ්‍යාත්මික ව පූර්ණ විමුක්තිය අත්දුටු

**පළමුවැන්නා ඔවුන්වහන්සේය.**

## උත්ථාන වූ ප්‍රතාපවත් ක්‍රිස්තුන් වහන්සේ

**උත්ථානය යනු ජේසුස් වහන්සේගේ සීමිත ශරීරය අසීමිත දේව ආදරයෙන් පිරී නවතාවකට පත් වීමයි. .**

මනුෂ්‍යයකු ලෙස තිබූ සීමාවන් සියල්ල අභිබවා ගොස් ඔවුන් වහන්සේ ප්‍රතාපවත් වී ඇත.

- එම නිසා ඔවුන් වහන්සේට සියල්ල විනිවිද ගෙන දකින්නට, යන්නට, ක්‍රියා කරන්නට හැකිවේ.
- ඔවුන් වහන්සේට මුළු විශ්වය පුරා වැඩ සිටින්නට හැකිවේ.
- සියලු දෙනා තුළ හා සියලු දේ තුළ වැඩ සිටින්නට හැකි වේ.
- සියල්ලන් හා එකවර සම්බන්ධතා පවත්වන්නට හැකි වේ.

"... මා පැමිණියේ ඔවුන් හට ජීවනය ලැබෙන පිණිස ය. සපුරා ම එය ලැබෙන පිණිස ය."

( ජොහාන් 10:10)

**ක්‍රියාකාරකම:**

- ජීවනය යනු කුමක් ද? ඔබ දෙපැත්තේ සිටින දෙදෙනා සමග අදහස් හුවමාරු කරගන්න.
- පන්තියට අදහස් ඉදිරිපත් කරන්න.

**"මනුෂ්‍යයා මෙලොව ජීවිතයේ මෙන් ම මතු ජීවිතයෙහි ද සතුටින් ජීවත්වීම දෙවියන් වහන්සේට ප්‍රශංසාවකි."**

**සාන්ත ඉරේනියස් තුමා**

## නව ආදම් තුළ නව ලොවක්..

මනුෂ්‍යයාගේ අකීකරුකම තුළින් නැති වූ දේව දරුකමේ උරුමය කිතු සමිඳුන්ගේ කීකරුකම තුළින් නැවත ලැබිණි. නව ආදම් වන්නේ ක්‍රිස්තුන් වහන්සේ ය. මුළු විශ්වය ශුද්ධවත් විය. ලෞකික සියල්ල පවිත්‍ර විය. දේව ජීවිතය අත්දැකීමේ භාග්‍යය මිනිසාට

උදාවිය. ක්‍රිත්වික ජීවිතය ගත කිරීමට පැවති බාධක බිඳී ගියේ ය.

මෙම පිරිපුන් ලොව බිහි වී ඇත්තේ පාපයේ විපාකයට යට වූ ලොව තුළ ම ය. එමනිසා එය අත්දැකිය හැක්කේ විශ්වාසයේ ආලෝකයෙන් පමණි. එය දේව ආත්මයාණන් තුළ ප්‍රීතියෙන් පිරි නිත්‍ය වූ ලොවකි.

"ක්‍රිස්තුන් වහන්සේ අපට ප්‍රේම කොට මිහිරි සුගන්ධ පූජාවක් ද යාගයක් ද හැටියට අප වෙනුවෙන් දෙවියන් වහන්සේට සිය ජීවිතය පරිත්‍යාග කළාක් මෙන්, ඔබත් ප්‍රේමයෙන් ජීවත් වන්න."

(එපිස 5:2)



ක්‍රිස්තු ධර්මය ගොඩනැගී ඇත්තේ මිය ගිය උදාර පුද්ගලයෙකුගේ සොහොනක් මත නොව මරණය මරා උත්ථාන වූ ජීවමාන ක්‍රිස්තුන් වහන්සේ මත ය. ඔවුන් වහන්සේ ජීවමාන බව ඥනාන්විතව දැනගැනීම කොහෙත්ම ප්‍රමාණවත් නොවේ.

ජීවමාන කිතු සමිඳුන් ඇසුරු කර ඔවුන් වහන්සේ හා හෘදයාංගම සම්බන්ධතාවක් ඇති කරගන්න. ඒ සම්බන්ධතාව ගැඹුරු කරගන්නා තරමට අපි සැබෑ ක්‍රිස්තු ශ්‍රාවකයෝ වෙමු. එවිට සැබෑ ලෙස අන් අයට ප්‍රේම කිරීමට හැකි වේ.

ක්‍රිස්තුන් වහන්සේගේ ජීවමාන ශරීරය වන දිව්‍ය සත්ප්‍රසාදයෙන් පෝෂණය ලබමින් සත්ප්‍රසාදයීය ජීවිතයක් ගත කරමින් නිත්‍ය මහිමයට ළඟා වෙමු. මෙලෙස කිතු සමිඳුන්ගේ පාස්කු අභිරහසට සහභාගි වන තරමට අප දේශය හා ලෝකය සුව පත් වනු ඇත.

## විමසා බලන්න. මෙනෙහි කරන්න.

**මරණය ජයගෙන උත්ථාන වූ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ පිළිබඳ ව සුභාරංචි ග්‍රන්ථවල සහ සංදේශවල දක්වෙන අනාවරණයෙන් කියවා මෙනෙහි කර ඒවා ජීවිතයට සම්බන්ධ කරගන්න.**

ශු. මතෙව් 28:111
ශු. මාක් 16:116
ශු. ලූක් 24: 149
ශු. ජොහාන් 20:129
1 කොරින්ති 15:1258
කොලොස්සි 1:18

## කළ යුතු දෑ

1. උත්ථාන වූ ප්‍රතාපවත් ස්වාමින් වහන්සේට ඔබගේ ම යාච්ඤාවක් තනන්න.
2. ඔබ දන්නා පාස්කු ගී සොයා පොත් පිංචක් සකස් කරන්න. එම ගීතිකා ගායනා කරමින් දෙවිඳුන්ට ප්‍රශංසා කරන්න.
3. ඔබගේ පවුලේ තිබෙන එදිනෙදා බරින් එකක් ක්‍රිස්තුන් වහන්සේ කුරුසය කරට ගත්තාක් මෙන් ගෙන ඔබ ක්‍රියා කරන ආකාරය කියන්න.
4. පහත දක්වෙන සිද්ධියෙන් කිතුනු ඔබට ලැබෙන මග පෙන්වීම් මොනවා දැයි සාකච්ඡා කරන්න.



## සිරකරුවාගේ නිදහස

ඒ අපරාධකරුවාට අධිකරණයෙන් මරණීය දණ්ඩනය නියම විය. එහෙත් එම දඬුවම ක්‍රියාත්මක කරන දිනය හෝ වේලාව තීරණය කර නැත. ඒ නිසා සිරකරුවා සිරකුටියක දෑඩි රැකවල් සහිත ව රඳවා තැබූහ. සෑම දිනයක ම ඒ තමාගේ දිනය යි සිතා ඔහු සිය දහස්වර සිතෙන් මැරෙන්නේ ය.

එක් සිකුරාදාවක ආරක්ෂක නිලධාරීහු කීප දෙනෙක් සිර කුටිය වෙත පැමිණියහ. එදා නියත වශයෙන් ම තමාගේ අවසාන දිනය යි සිරකරුවාට සිතුනි. චිත්ත වේගය දරා ගත නොහැකි ව දෙ දණ පණ නැති වී ඔහු බිම වැටිණ. නිලධාරීන් දෙදෙනෙක් ඔහු පිටතට ගෙන

"බරබ්බාස් උඹ නිදහස්" යයි කීහ. සිරකරුවා එය සිහිනයක් දැයි පුදුමයෙන් බලා සිටියේ ය. මිනිහෝ උඹ නිදහස් යයි නිලධාරීහු සිරකරුවා ඉදිරියට තල්ලු කළහ. නිදහස් වූ සිරකරුවා පාර දිගේ යද්දී ඈත කඳු ගැටයක කුරුස තුනක ඇණ ගසා මරා දමා සිටි පුද්ගලයන් තිදෙනෙකු දුටුවේ ය. මේ අපරාධකරුවන් කවුරුන් දැයි නැවතී කල්පනා කරමින් සිටින විට එතැනින් පියමං කළ මගියකුගෙන් ඒ ගැන විමසුවේ ය. මගියා උත්තර දුන්නේ ය.

"අර මැද කුරුසෙ මැරිලා ඉන්න එක්කෙනා නිසා අද උඹ ජීවත්වනවා."

**වැඩිදුර අධ්‍යයනය සඳහා..**

ක්‍රිස්තුන් වහන්සේගේ
පාස්කු අභිරහස සුබ අස්නේ හදවත බව
කතෝලික ධර්මෝපදේශය පෙන්වා දෙයි.
ආරම්භයේ දී උන්වහන්සේගේ දේශනයන්ට බොහෝ
ජනතාව ඇදී ආවත්, ව්‍යවස්ථාව, දේව මාළිගාව හා
දෙවියන් වහන්සේ පිළිබඳ ව ඔවුන් වහන්සේ දැක්වූ ආකල්ප නිසා
ඊශ්‍රායෙල් ආගමික නායකයෝ ඔවුන් වහන්සේ සමග උරණ වූහ.
පව්කාරයන් කෙරෙහි දැක්වූ අනුකම්පාව දෙවියන් වහන්සේ පව්කාරයින්
කෙරෙහි දක්වන අනුකම්පාවට සමාන බව කීම ඔවුහු නොපිළිගත්හ. ලූක්
සුවිශේෂයේ 15 වන පරිච්ඡේදයේ දැක්වෙන නැතිවුණු බැටළුවා,
නැතිවුණු කාසිය හා නැතිවුණු පුත්‍රයා යන උපමා මීට කදිම නිදසුන් ය.
ජේසුස් වහන්සේ පියාණන් වහන්සේ සමග එක්කෙනකු වන බව කීම ඔවුන්ට
දැරිය නො හැකි විය. ඒ නිසා ඔවුහු ඔවුන් වහන්සේ නඩු තීන්දුව සඳහා පිලාත්
වෙතට ගෙන ආවෝය. ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ දුක් ප්‍රාප්තියට හා දුක්ඛිත
මරණයට වගකිව යුත්තේ ජුදා ජාතිය පමණක් නොව මුළු පව්කාර ලෝකය ම බව
අවධාරණය කිරීමට ධර්මෝපදේශය තැත් කරයි. ගල්ලෙන ළඟ සිටි දේව දූතයාගේ
වචනය වූයේ "ඔවුන් වහන්සේ උත්ථාන වූ සේක." (මාක් 16:6). මනුෂ්‍ය ඉතිහාසයේ
කිසි විටෙකත් සිදු නො වූ සිද්ධියක් ගැන මේ වාක්‍යයෙන් කියැවේ.
ජේසුස් වහන්සේගේ උත්ථානය එක්වරක් පමණක් වූ සිද්ධියකි. එලෙස ම ඔවුන්
වහන්සේ උත්ථාන වූ ලෝකයේ සැම කාලයක ම වෙසෙන සියලු මනුෂ්‍යයින්
උදෙසා ලාසරස් සහ නායිම් නුවර වැන්දඹුවගේ පුත්‍රයා ජේසුස් වහන්සේ විසින්
උත්ථාන කරනු ලැබූවත් ඔවුන් නැවත මරණයට පත්වූහ. ඔවුන් වහන්සේ
මළවුන්ගෙන් උත්ථාන වීම සම්පූර්ණ අලුත් සිද්ධියකි. එය මරණයෙන් ආපසු
පැමිණීමක් නොව මරණය අභිබවා ගොස් එය ජයග්‍රහණය කිරීමකි.
අලුත් පැවැත්මකට මුල පිරීමකි. උත්ථාන වූ තැනැත්තා කාලයත්,
ප්‍රමාණයත් අභිබවා ගොස් ඇත. ඔවුන් වහන්සේ සැම තැන ම
වැඩ සිටිති. ඔවුන් වහන්සේ ඉතිහාසයටත්, සැම දෙනාටත්
අයිති වේ. ඔවුන් වහන්සේ අප අතර වැඩ සිටිති.

**(කතෝලික සභාවේ ධර්මෝපදේශය
අංක 571679 දක්වා)**